# මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
மனிதவலுமற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
DEPARTMENT OF MANPOWER AND EMPLOYMENT

9 වනමහල | 9th Floor | 9ம் மாடி
සෙත්සිරිපාය 2 වනඅදියර | Sethsiripaya 2nd Stage | செத்சிரிபாய 2ம் கட்டம்
බත්තරමුල්ල | Battaramulla | பத்தரமுல்லை


මගේ අංකය / எனது இல / My No: DME/05/CGD/06/02-i

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021-08

සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් වෙත,

**<u>වෘත්තීය මාර්ගෝපදේශ සතියක් ක්‍රියාත්මක කිරීම</u>**

මගේ අංක DME/05/CGD/06/02 හා 2021.07.07 දිනැතිව වෘත්තීය මාර්ගෝපදේශ සතිය ක්‍රියාත්මක කිරීමට අදාලව නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛය සම්බන්ධයෙන් මෙහි සඳහන් සංශෝධන නිකුත් කරනු ලැබේ.

02.අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතුරින් ප්‍රමුඛ කාර්යයක් වන වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ සංකල්පය ජනගත කිරීම සඳහා වාර්ෂිකව සැලසුම් කරන ලද වෘත්තීය මාර්ගෝපදේශ සතිය මෙම වසරේ මාර්ගගත ක්‍රමයට ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.

03.ඒ අනුව වෘත්තීය මාර්ගෝපදේශ සතිය සම්බන්ධයෙන් පහත විධිවිදාන ක්‍රියාත්මක කෙරේ.

3.1 මෙහිදී චිත්‍ර, කවීක, ගද්‍ය රචනා,පද්‍ය රචනා සහ දැනුම මිනුම යන තරඟ පැවැත්වෙන අතර පවත්වන තරඟ සම්බන්ධයෙන් වූ පොදු කොන්දේසි වනුයේ,

I. චිත්‍ර, කවීක, ගද්‍ය රචනා,පද්‍ය රචනා සඳහා පහත මාතෘකා වලින් එකක් භාවිතා කළ යුතුය,

- **ශ්‍රී ලංකාවේ ශ්‍රම ඵලදායීතාවය තුළ අනාගත වැඩ ලොව ජයගන්නට වෘත්තීය මාර්ගෝපදේශයයේ වැදගත්කම**
- **21 වන සියවස හා වෘත්තීය මාර්ගෝපදේශය**
- **සිහින දකිමු, සැලසුම් කරමු, වැඩ ලෝකය හැඩ කරමු,**
- **රටේ සංවර්ධනයට තරුණ ප්‍රජාවේ දායකත්වය**
- **රටකට වෘත්තීය මාර්ගෝපදේශ සේවාවක ඇති වැදගත්කම**

II. එක් එක් තරඟ සඳහා වෙන වෙනම අයදුම්පත් කැඳවන අතර ඒ සඳහා Google form එකක් ලබාදේ.

III. තම අයදුම්පත සමඟ නිර්මාණය (දෙපැත්තම) ජායාරූප ලෙස එවිය යුතු අතර නිර්මාණය පිටිපස නම , ලිපිනය ,ශ්‍රේණිය, වයස , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, දිස්ත්‍රික්කය, සඳහන් කළ යුතුය.


අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General 0112186022

කාර්යාලය / ෆැක්ස් / அலுவலகம் / தொலைநகல / Office /Fax 011 2187131, 011 2187133

ගිණුම් අංශය / கணக்குக்கிளை / Accounts Branch 011 2186173

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல / e-mail dg@dome.gov.lk info@dome.gov.lk

IV. චිත්‍ර, ගද්‍ය රචනා සඳහා ඉදිරිපත්වන දරුවන්ගේ නිර්මාණය පසුපස තම නිර්මාණය ස්වයං නිර්මාණයක් බවට තමා විසින්ම තහවුරු කිරීමක් කළ යුතුය.

3.2 එක් එක් තරඟ සම්බන්ධයෙන් අදාළ වන කොන්දේසි

3.2.1 **චිත්‍ර තරඟය**

I. මෙම තරඟය සඳහා අයදුම්පත් කැඳවනුයේ 9,10,11 ශ්‍රේණි වල සිසු දරු දැරියන්ගෙන් පමණි,

II. උක්ත මාතෘකාවලින් කැමති මාතෘකාවට අදාළව චිත්‍රය ඇඳිය යුතු ය,

III. චිත්‍රය ඇඳීම සඳහා ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැකිය,( පැස්ටල් , දිය සායම්......)

IV. චිත්‍රය ඇඳීම සඳහා 8.27"X 11.69"ප්‍රමාණයේ කොළයක් එනම් A-4 ප්‍රමාණයේ කඩදාසියක් භාවිතා කළ යුතුය

3.2.2 **පද්‍ය රචනා**

I. මෙම තරඟය සඳහා අයදුම්පත් කැඳවනුයේ 9,10,11 ශ්‍රේණි වල සිසු දරු දැරියන්ගෙන් පමණි,

II. තෝරාගත් මාතෘකා එකක් යටතේ පද්‍ය නිර්මාණය කළ යුතුය

III. පද්‍ය පන්තියක පද්‍ය 05- 10ක් අතර වියයුතුය

IV. පද්‍ය රචනා තරඟය සඳහා සඳැස් පද්‍ය නිරමාණ පමණක් ඉදිරිපත් කළ යුතුය.

**3.2.3 ගද්‍ය රචනා**

මෙම තරඟය පාසල් සිසුන් සහ වැඩිහිටියන් යන කණ්ඩායම් දෙකක් සඳහා පවත්වනු ලබයි.

3.2.3.1 පාසල් සිසුන් සඳහා ගද්‍ය රචනා

I. මෙම තරඟය සඳහා අයදුම්පත් කැඳවනුයේ 9,10,11 ශ්‍රේණි වල සිසු දරු දැරියන්ගෙන් පමණි,

II. වචන 300 ත් 500ත් අතර විය යුතු ය සහ A4 පිටු 02 -3ත් අතර,

III. උක්ත මාතෘකාවලින් තෝරාගත් මාතෘකාවකට අනුව ලිවිය යුතුය ,

3.2.3.2 වැඩිහිටියන් සඳහා ගද්‍ය රචනා-විවෘත තරඟය

I. මෙම තරඟය සඳහා ඉදිරිපත් විය යුත්තේ වයස 18 ට වැඩි වැඩිහිටියන් පමණි,

II. මෙම තරඟය සඳහා මාතෘකා වනුයේ

- **සාර්ථක වෘත්තිකයකු වීමට ව්‍යවසායකත්වය**
- **ව්‍යවසායකත්වය තුළින් ආර්ථිකය ශක්තිමත්ව ජයගන්න**
- **ව්‍යවසායකත්ව සංස්කෘතියක් ඇති කිරීමටනම්**

III. මෙම මාතෘකා වලින් තෝරාගත් මාතෘකාවක් යටතේ ගද්‍ය රචනාවක් ඉදිරිපත් කළ යුතුය

IV. ගද්‍ය රචානාව වචන 750 – 1000ත් අතර වියයුතුය,

**3.2.4 කථික තරඟය**

I. මෙම තරඟය සඳහා අයදුම්පත් කැඳවනුයේ 9,10,11 සිසු දරු දැරියන්ගෙන් පමණි

II. විනාඩි 2 ක් 3ක් අතර කාලයක් කතා කළ යුතුය

III. වැඩි විස්තර තරඟය පැවැත්වෙන දිනයේදී දැනුම් දෙනු ලැබේ.

**3.2.5 දැනුම මිනුම**

I. ප්‍රශ්න ඉදිරිපත් කරනු ලබන්නේ වෘත්තීය මාර්ගෝපදේශය විෂය ට අදාලව යි,

II. මෙම තරඟය සඳහා අයදුම්පත් කැඳවනුයේ 9,10,11 සිසු දරු දැරියන්ගෙන් පමණි

III. අයදුම්කරුවන් කලින් අයදුම්පත් කැඳවා ලියාපදිංචි කරවා ගනු ලැබේ

IV. ප්‍රශ්ණ 25 කින් සමන්විත මර්ගගත බහුවරණ ප්‍රශ්න පත්‍රයක් ලබාදේ. කාලය විනාඩි 30කි,

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක නිලධාරියෙකු විසින් මෙම එක් එක් තරඟ සඳහා අවම වශයෙන් තරඟකරුවන් 20 දෙනෙකු සහභාගී කර විය යුතුය . එය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර තරඟයක් ලෙස සැලකේ.

05.නිලධාරීන්ගේ දරුවන් සඳහා වූ තරඟය **"අම්මාගේ හෝ තාත්තාගේ රැකියාව දරුවා දකින ආකාරය "** සම්බන්ධයෙන් අදියර දෙකක් යටතේ පවත්වනු ලැබේ.

I. වචන 150 ත් 200 ත් අතර ප්‍රමාණයක ගද්‍ය රචනාවක් ලිවීම
9 වන වසර දක්වා වූ දරුවන් පමණක් එම තරඟය සඳහා ඉදිරිපත් විය යුතු ය.

II. වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳව රුවන් වැකි ලිවීම
10, 11, 12, ශ්‍රේණි වල දරු දැරියන් මෙම තරඟය සඳහා ඉදිරිපත් වියයුතුය

06. තරඟ පැවැත්වීම

6. 1. **අයදුම්පත් කැඳවීම**

I. සියලුම තරඟ සඳහා අයදුම්පත් Google form එකක් හරහා මාර්ගගත ක්‍රමයට දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත කැඳවනු ලැබේ.

II. අයදුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ සබැඳිය (Link) දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සහ Face Book පිටුව මඟින් භාගත කරගත හැකිය.

III. අයදුම්පත් කැඳවනුයේ අගෝස්තු මස 23 දින සිට සැප්තැම්බර් මස 13 දින දක්වා පමණි.

IV. සියලුම අයදුම්පත් සැප්තැම්බර් මස 13 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට කටයුතු කළ යුතුය

V. ගද්‍ය රචනා,පද්‍ය රචනා සහ චිත්‍ර තරඟවල අයදුම්පත් සමඟ නිර්මාණය ඉදිරිපත් කළ යුතුය.

VI. ජාතික මට්ටමේ විනිශ්චය මණ්ඩලයක් මඟින් අදියර තුනක් යටතේ ඇගයීම් කටයුතු සිදු කරනු ලැබේ.

VII. ඒ අනුව ගද්‍ය රචනා,පද්‍ය රචනා සහ චිත්‍ර තරඟ ප්‍රාදේශීය , දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ තේරීම් කටයුතු සිදු කරනු ලැබේ.

VIII. කථික තරඟ පමණක් ප්‍රමාණවත් තරම් අයදුම්පත් නොතිබුණ හොත් ජාතික මට්ටමින් පමණක් සිදු කරනු ලැබේ.

### 6.2. ත්‍යාග සහ සහතිකපත් ලබාදීම

I. සියලුම තරඟ සඳහා සහභාගීත්ව සහතිකයක් ලබා දෙනු ලැබේ.

II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් තේරුණු ජයග්‍රාහකයන් සඳහා ප්‍රථම ස්ථානය , දෙවන ස්ථානය සහ තෙවන ස්ථානය යන ස්ථාන සඳහා සහතික පත් පමණක් නිකුත් කරනු ලැබේ.

III. දිස්ත්‍රික් තරඟ සඳහා සහතික පත්‍ර සමඟ පහත ආකාරයෙන් මුදල් ත්‍යාගයක් ද පිරිනමනු ලැබේ.

| | |
|---|---|
| පළමු ස්ථානය | රු. 5000.00 |
| දෙවන ස්ථානය | රු. 3000.00 |
| තුන් වන ස්ථානය | රු. 2000.00 |

IV. ජාතික මට්ටමේ තරඟ සඳහා සහතික පත් සහ මුදල් ත්‍යාගයක් පහත ආකාරයට පිරිනමනු ලැබේ.

| | |
|---|---|
| පළමු ස්ථානය | රු. 25000.00 |
| දෙවන ස්ථානය | රු. 15000.00 |
| තුන් වන ස්ථානය | රු. 10000.00 |

V. තවද ජාතික මට්ටමේ තරඟ සඳහා රු. 3000 බැගින් සැනසිලි ත්‍යාග 10ක් පිරිනැමීම සිදු කෙරේ.

### 6.3 ප්‍රචාරණ කටයුතු

6.3.1 විද්‍යුත් මාධ්‍ය ,පුවත්පත් සහ ප්‍රාදේශීය මට්ටමේ ගුවන් විදුලි නාලිකා මගින් සහ Face book , Whats App, .....Social Media හරහා ප්‍රචාරණය කිරීම් සිදු කිරීම.

6.3.2 එක් එක් නාලිකා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පහත නිලධාරීන්ට වගකීම පවරනු ලැබේ.

වයඹ ගුවන් විදුලිය - කුරුණෑගල, එන්.කේ.බී.කරුණාරත්න මයා
රජරට ගුවන් විදුලිය - අනුරාධපුරය, විජිතා දළුවත්ත මිය
රන්ගිරි ගුවන් විදුලිය -මාතලේ,දඹුල්ල මා.සම්.සං නි , එච්.එම්.කරුණාරත්න
ඌව ගුවන් විදුලිය - බදුල්ල -ඇල්ල, ජගත් දිසානායක මයා,
රුහුණු ගුවන් විදුලිය -මාතර, ජනිත තිලනාත් මයා
කන්දඋඩරට ගුවන්විදුලිය -මහනුවර, ප්‍රියන්ත පද්මකුමාර මයා,
Capital Fm -යාපනය, K.කරුණාකරන් මයා,
Tamil TV - යාපනය, K. කරුණාකරන් මයා

6.3.3 දිස්ත්රික් ලේකම් කාර්යාලයන්හි පවත්වාගෙන යන web අඩවි සහ Face Book page මඟින්ද ප්‍රචාරණ කටයුතු සිදුකිරීම

6.3.4. විරිඳු , බයිලා, රූකඩ, වීදිනාට්‍ය ආදී වැඩ සටහන් වීඩියෝ මඟින් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම

සිංහල මාධ්‍යයෙන්

- ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී - රූකඩ වැඩසටහනක්
- පොලොන්නරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී -වීදිනාට්‍යයක්
- අනුරාධපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී - බයිලා සහ විරිඳු
- කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී - බයිලා
- නුවරඑළිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී - අණ බෙර කරුවෙකුගේ භූමිකාවක්

දෙමළ මාධ්‍යයෙන්

- යාපනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී- වීදි නාට්‍යයක්
- අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධා -රී බයිලා වැඩසටහනක්
- මන්නාරම සහ මඩකලපු දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරී - වීදිනාට්‍යය
- ප්‍රාදේශීය ගුවන් විදුලි මාධ්‍ය ආයතන මඟින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම සඳහා ඒඒ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා වගකීම් පැවරීම,

07. ඔක්තෝම්බර් 4 සිට 10 දින දක්වා සතියේ වැඩසටහන පහත ආකාරයට සැලසුම් කරනු ලැබේ.

7.1 **ඔක්තෝම්බර් 4 - සමාරම්භක උත්සවය**

I. සමාරම්භක අවස්ථාවට සමගාමීව දිස්ත්‍රික් උත්සව සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අදාළ සියලුම ආයතන මාර්ගගත ක්‍රමයට සම්බන්ධ කරගෙන සහ ජාතික උත්සවය ප්‍රධාන කාර්යාලයේ දී අමාත්‍යාංශ ලේකම්තුමා සහ දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කිරීම.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் 0112186022
Director General
කාර්යාලය / ෆැක්ස්
அலுவலகம் 011 2187131
தொலைநகல
Office /Fax 011 2187133
ගිණුම් අංශය
கணக்குக்கிளை 011 2186173
Accounts Branch
විද්‍යුත් තැපෑල dg@dome.gov.lk
மின்னஞ்சல info@dome.gov.lk
e-mail

II. මාර්ගගත කථික තරඟය පැවැත්වීම

III. ප.ව. 6.3.-7.30 - අ.පො. ස. (උ.පෙ.) සිසුන් දැනුම්වත් කිරීමේ Life talk මාර්ගගත වැඩසටහන

7.2 **ඔක්තෝම්බර් 5**

i. දැනුම -මිනුම තරඟ පලමු සහ දෙවන වට පැවැත්වීම
ii. ප.ව. 7.00-8.00 - උපාධි අපේක්ෂිතයින් දැනුම්වත් කිරීමේ Life talk මාර්ගගත වැඩසටහන

7.3 **ඔක්තෝම්බර් 6**

i. දැනුම මිනුම තරඟය අවසාන වටය
ii. ප.ව. 5.00- 6.00 9 වසර සිසුන් දැනුම්වත් කිරීමේ Life talk මාර්ගගත වැඩසටහන

7.4 **ඔක්තෝම්බර් 7**

i. Career Test සිදු කිරීම
ii. ප.ව. 5.00- 6.00 ගුරුවරුන් දැනුම්වත් කිරීමේ Life talk මාර්ගගත වැඩසටහන
iii. ප.ව. 6.30- 7.30 අ.පො.ස. (සා.පෙ.) සිසුන් දැනුම්වත් කිරීමේ Life talk මාර්ගගත වැඩසටහන
iv. දිස්ත්‍රික් මට්ටමේ මාර්ගගත රැකියා පොළ වැඩසටහන (Job Fair)

7.5 **ඔක්තෝම්බර් 8**

i. Career Test සිදු කිරීම
ii. ප.ව. 7.00- 8.00 ස්වයං රැකියා සඳහා පෙළඹවීමේ වෘත්තීය මාර්ගෝපදේශ Life talk මාර්ගගත වැඩසටහන
iii. ප.ව. 7.00- 9.00 වෘත්තීය මාර්ගෝපදේශ සම්බන්ධ webinar වැඩසටහන
iv. දිස්ත්‍රික් මට්ටමේ මාර්ගගත රැකියා පොළ වැඩසටහන (Job Fair)

7.6 **ඔක්තෝම්බර් 9**

i. Career Test සිදු කිරීම
ii. ප.ව. 8.00- 9.00 දෙමාපියන් දැනුම්වත් කිරීමේ වෘත්තීය මාර්ගෝපදේශ Life talk මාර්ගගත වැඩසටහන
iii. ජාතික මට්ටමේ මාර්ගගත රැකියා පොළ වැඩසටහන (Job Fair) කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක ඒකාබද්ධව සිදු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் 0112186022
Director General

කාර්යාලය / ෆැක්ස්
அலுவலகம் 011 2187131
தொலைநகல
Office /Fax 011 2187133

ගිණුම් අංශය
கணக்குக்கிளை 011 2186173
Accounts Branch

විද්‍යුත් තැපෑල dg@dome.gov.lk
மின்னஞ்சல info@dome.gov.lk
e-mail

7.7 **ඔක්තෝම්බර් 10**

තෲාග සහ සහතිකපත්‍ර ලබාදීම

08. මෙම වැඩසටහන දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යයක් බැවින් ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් මෙයට සක්‍රීයව සම්බන්ධ වී වගවීමෙන්, කැපවීමෙන් හා නිර්මාණශීලීව තමා වෙත පැවරෙන කාර්යයන් ඉටුකර මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

අනූෂා ගෝකුළ ප්‍රනාන්දු

අධ්‍යක්ෂ ජනරාල්


අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம் 0112186022
Director General

කාර්යාලය / ෆැක්ස්
அலுவலகம் 011 2187131
தொலைநகல
Office /Fax 011 2187133

ගිණුම් අංශය
கணக்குக்கிளை 011 2186173
Accounts Branch

විද්‍යුත් තැපෑල dg@dome.gov.lk
மின்னஞ்சல info@dome.gov.lk
e-mail